tŷ pawb

Marchnadoedd —— Cymuned —— Celfyddydau
Markets —— Community —— Arts

## කලාකරුවන්ගේ පහසුකම් සපයන්නන්ට කරන විවෘත ඇරයුම: බහුභාෂා පවුල් කලා සමාජය

Tŷ Pawb අපගේ තිනිර්මාණය කළ Family Art Club හි කොටසක් ලෙස මාසික සැසි පැවැත්වීමට ද්විභාෂා (හෝ බහුභාෂා) කලාකරුවන්ගෙන් කැමැත්ත පළ කිරීම කැඳවයි.

### අප ගැන

Tŷ Pawb යනු කලාව සහ වෙළඳපළ එකම පියසටහනක් තුළ එක් කරන සංස්කෘතික ප්‍රජා සම්පතකි. මෙම සහජීවනය රෙක්ස්හැම් හි සංස්කෘතික උරුමය සහ අනන්‍යතාවය තුළ වෙළඳපළ වල වැදගත්කම සමරයි. Tŷ Pawb යනු සමාජ සහ සිවිල් ගැටළු, පරිසරය, සෞඛ්‍යය, සංස්කෘතික අනන්‍යතාවය, තිරසාරභාවය සහ අධ්‍යාපනය ඇතුළු විෂයයන් පිළිබඳ සංවාදය සඳහා අවකාශයකි.

### පසුබිම

Family Art Club අපගේ දියත් කළ දා සිට Tŷ Pawb වැඩසටහනේ ස්ථාවර කොටසක් වී ඇති අතර, සෑම සෙනසුරාදා දිනකම උදේ කාලීන කාලසීමාව තුළ කලාකරුවන් නායකත්වය දෙනු ලබන නිර්මාණකරණයේ නිරත වීමට පවුල්වලට අවස්ථාව සලසා දෙයි. මෙම සමාජය දරුවන් පමණක් නොව, දෙමාපියන් සහ රැකබලා ගන්නන් ද නිර්මාණය කිරීම දිරිමත් කරයි. මෙම සමාජය පිරිනමනු ලබන්නේ 'ඔබට හැකි දේ ගෙවන්න' පදනම මතය.

රෙක්ස්හැම් හි විවිධ ප්‍රජාවන් පිළිබිඹු කිරීමට සහ ඔවුන් සමඟ සම්බන්ධ වීමට අපගේ අඛණ්ඩ මෙහෙවරෙහි කොටසක් ලෙස, වෙල්ෂ් සහ ඉංග්‍රීසි භාෂා වලට වඩා පුළුල් පරාසයක ඉදිරිපත් කිරීමේ භාෂා ඇතුළත් කිරීමට අපි Family Art Club හි ආකෘතිය අපි වෙනස් කරන්නෙමු.

Multilingual Family Art Club ව්‍යාපෘතිය සියලු පසුබිම්වල පවුල් සහභාගී වීමට සාදරයෙන් පිළිගනියි. කලාව කෙරෙහි අවධාරණය යොමු කරන අතර, සැසි ද්විභාෂාවෙන් පවත්වනු ලැබේ, එමඟින් කලාකරුවාගේ පළමු/අමතර භාෂාවෙන් හෝ ඉංග්‍රීසියෙන් සහභාගි වීමට පවුල්වලට අවස්ථාව ලැබේ. ඔවුන් ඉංග්‍රීසි හෝ වෙනත□ භාෂාවක් විධිමත් ලෙස ඉගැන්වීම පිළිබඳව වඩා විනෝද වීමට සහ 'අවසර දීම' අවධාරණය කරමින්, පළමු භාෂාව කතා කරන්නන් සහ ආරම්භකයින් යන දෙපිරිසටම අවස්ථාව ලබා දිය යුතුයි.

කලාකරුවන් හතර දෙනෙකු වැඩසටහන ඉදිරිපත් කරනු අතර සෑම කෙනෙකුම මසකට ක්‍රියාකාරකම් පවුල් වලට උත්සාහ කිරීමට ප්‍රමාණවත් තරම් විවිධ ද්‍රව්‍ය සහ ශිල්පීය ක්‍රම ලබා දෙන බව සහතික කිරීම සඳහා කලාකරුවන් නිතිපතා හමුවිය යුතුයි.

### පුද්ගල පිරිවිතර

- ලියාපදිංචි ස්වයං රැකියාලාභීන් සහ එක්සත් රාජධානියේ වැඩ කිරීමට සුදුසුකම් ලැබී තිබීම
- වෙනත් භාෂාවකින් හොඳ ප්‍රමිතියකට සන්නිවේදනය කිරීමට හැකිවීමට අමතරව ඉංග්‍රීසි හෝ වේල්ස් භාෂාවෙන් හොඳ ප්‍රමිතියකට සන්නිවේදනය කිරීමට හැකිවීම
- කණ්ඩායම් පරිසරයක් තුළ විවිධ අවශ්‍යතා සහ හැකියාවන් සඳහා සහාය වන, ළමුන් සඳහා උසස් තත්ත්වයේ නිර්මාණාත්මක සහභාගීත්ව කලා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සහ ලබා දීම පිළිබඳ පළපුරුද්දක් තිබීම
- විවිධ පරාසයක පවුල් සඳහා උණුසුම්, පිළිගැනීමේ සහ ප්‍රබෝධමත් ඉගෙනුම් අත්දැකීමක් නිර්මාණය කිරීමට උත්සාහ කිරීම

Tŷ pawb
Marchnadoedd —— Cymuned —— Celfyddydau
Markets —— Community —— Arts

- අපගේ සහභාගිවන්නන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අපේ ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියා පටිපාටි ආරක්ෂා කිරීමට කැපවී සිටීම
- මෙම භූමිකාව වැඩිදියුණු කළ හෙළිදරව් කිරීමේ සහ බාධා කිරීමේ සේවාව (Disclosure and Barring Service (DBS)) පරීක්ෂාවකට යටත් වේ

**සැපයිය යුතු දේ**

කලා කටයුතු සම්බන්ධීකාරක වෙත කල්තියා සැසි සැලසුම් සැපයීම.

සැසිවාර වලට පෙර කල්තියා සුදුසු උපකරණ සහ ද්‍රව්‍ය සකස් කර ඇති බව සහතික කිරීම, (Tŷ Pawb රැක බලාගන්නන්ගේ සහාය ඇතිව මේස සහ පුටු සැකසීම).
පර්යේෂණ කර, සැලසුම් කර, නිර්මාණාත්මක වැඩමුළු 6ක් පැවැත්වීම, ඒවායේ පහත දේ තිබිය යුතුය.

- රෙක්ස්හැම් හි සංස්කෘතික විවිධත්වයෙන් හෝ ක්‍රීඩා අගනගරය ලෙස රෙක්ස්හැම් යන්නෙන් පෙළඹවී තිබීම
- කලා ආකෘති, ශිල්පීය ක්‍රම සහ ද්‍රව්‍ය මාලාවක් ඇතුළත් වී තිබීම
- වයස අවුරුදු 4-11 අතර දරුවන් සිටින පවුල් සඳහා සුදුසු වීම
- භාෂාමය හැකියාව නොසලකා සියලුම සහභාගිවන්නන් සඳහා ඇතුළත් කරගත හැකි දෙයක් විය යුතුයි

පහත සඳහන් ඇතුළුව අපගේ වාර්තා කිරීමේ වගකීම් සඳහා තොරතුරු රැස් කිරීම සහ සටහන් කර ගැනීම:

- සහභාගිවන්නන්ගේ පැමිණීම් සංඛ්‍යාව
- සහභාගිවන්නන්ගේ ප්‍රතිපෝෂණ
- ඡායාරූප එකඟත්ව ආකෘති සහ සැසිවල ඡායාරූප (මේ දෙකම අපගේ අලෙවිකරණ නිලධාරියාට සැපයිය යුතුය)

සැසිය අවසානයේ ප්‍රයෝජනවත් කලා අවකාශය (Useful Art Space) සහ පවුල් කලා ක්ලබ් අලුමාරිය (Family Art Club Cupboard) හොඳ තත්ත්වයෙ ආපසු තැබීම සහ සහ සියලුම ද්‍රව්‍ය සහ උපකරණ ආරක්ෂිතව හා පිළිවෙලට ගබඩා කර ඇති බව සහතික කිරීම.

Tŷ Pawb සෞඛ්‍ය සහ ආරක්ෂක, සුරක්ෂිතභාව සහ පාරිසරික ප්‍රතිපත්තියට අනුකූල වීම සහ ව්‍යාපෘතියට සම්බන්ධ සියලු දෙනාටම ගෞරවනීය ලෙස සාධාරණව සැලකීම.

**ගාස්තු සහ කාලසීමා**

අපි 2023/24 පුරා සැසි 40 ක් පැවැත්වීමට බලාපොරොත්තු වෙමු.

මෙයින් අදහස් කරන්නේ මෙම ව්‍යාපෘතියට සම්බන්ධ සෑම කලාකරුවෙක්ම සැසිවාරයකට £125 බැගින් සැසි 10 බැගින් පැවැත් විය යුතු අතර එහි එහි ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ ගාස්තුව පවුම් £1250 වනු ඇත.

මීට අමතරව, Tŷ Pawb හි දැනටමත් නොමැති ඕනෑම විශේෂඥ ද්‍රව්‍ය හෝ උපකරණ සඳහා ගෙවීමට සෑම කලාකරුවෙක්ම £250 දක්වා ව්‍යාපෘති අයවැයක් කළමනාකරණය කරනු ඇත.

Multicultural Family Art Club පෙබරවාරි 4[වන] සෙනසුරාදා දියත් කෙරේ.

Tŷ pawb

Marchnadoedd — Cymuned — Celfyddydau
Markets — Community — Arts

**කැමැත්ත ප්‍රකාශ කිරීම**

මෙම භූමිකාව පිළිබඳ ඔබේ කැමැත්ත ප්‍රකාශ කිරීමට, කරුණාකර CV එකක් සහ අදාළ ඕනෑම වෙබ් සබැඳියක් heather.wilson@wrexham.gov.uk වෙත ඊමේල් කළ යුතු අතර මෙම සබැඳිවලට කළඹ, මිනිත්තු 5කට අඩු වීඩියෝ, සමාජ මාධ්‍ය හෝ  මෙම භූමිකාව සඳහා ඔබේ යෝග්‍යතාව පෙන්නුම් කරන වෙනත් අන්තර්ගතයන් ඇතුළත් විය හැක.

අපි විශේෂයෙන් පෝලන්ත භාෂාව (2.49%) සහ පෘතුගීසි භාෂාව (0.53%) ඇතුළුව රෙක්ස්හැම් හි වැඩිපුරම භාවිතා වන සියලුම අමතර භාෂා (බ්‍රිතාන්‍ය සංඥා භාෂාව ඇතුළුව) කථාකරන්නන්ගෙන්,  අයදුම්පත් සාදරයෙන් පිළිගනිමු.

පරමාදර්ශී අපේක්ෂකයාට Tŷ Pawb හි 'Arte Util' ආචාර ධර්ම පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුයි.

**සියලු Multicultural Family Art Club දිනයන්:**

04/02/23 – කලාකරු 1

11/02/23 – කලාකරු 2

18/02/23 – කලාකරු 2

25/02/23 – සැසි කිසිවක් නැත (අර්ධ වාරය)

04/03/23 – කලාකරු 4

11/03/23 – කලාකරු 1

18/03/23 – කලාකරු 2

25/03/23 – කලාකරු 3

01/04/23 – කලාකරු 1

30/02/24 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)

30/02/24 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)

22/04/23 - කලාකරු 1

29/04/23 - කලාකරු 2

06/05/23 – කලාකරු 3

13/05/23 – කලාකරු 4

20/05/23 – කලාකරු 1

27/05/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)

03/06/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)

10/06/23 – කලාකරු 2

17/06/23 – කලාකරු 3

24/06/23 – කලාකරු 4

01/07/23 – කලාකරු 1

08/07/23 – කලාකරු 2

15/07/23 – කලාකරු 3

22/07/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)

29/07/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
05/08/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
12/08/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
19/08/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
26/08/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
02/09/23 – කලාකරු 4
09/09/23 – කලාකරු 1
16/09/23 – කලාකරු 2
23/09/23 – කලාකරු 3
30/09/23 – කලාකරු 4
07/10/23 – කලාකරු 1
14/10/23 – කලාකරු 2
21/10/23 – කලාකරු 3
28/10/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
04/11/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
11/11/23 – කලාකරු 4
18/11/23 – කලාකරු 1
25/11/23 – කලාකරු 2
02/12/23 – කලාකරු 3
09/12/23 – කලාකරු 4
16/12/23 – කලාකරු 1
23/12/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
30/12/23 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
06/01/24 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
13/01/24 – කලාකරු 2
20/01/24 – කලාකරු3
27/01/24 – කලාකරු 4
03/02/24 – කලකරු 1
02/02/24 – කලාකරු 2
02/02/24 – කලාකරු 2
16/02/24 – කලාකරු 4
23/02/24 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)
30/02/24 - කිසිදු සැසියක් නැත (පාසල් නිවාඩු)